මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

# ලංසු ලේඛණ කට්ටලය

## මෝටර් රථයක් අපහරණය කිරීම සඳහා ලංසු කැඳවීම

**ලංසු අංකය : - DLB/PRO/2025/35**

ලංසුකරුගේ නම :- ------------------------------------------------------------

ලදුපත් අංකය :- ------------------------------------------------------------

නිකුත්කලේ :- ------------------------------------------------------------

සංවර්ධන ලොතරැයි මණ්ඩලය
අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත,
යුනියන් පෙදෙස, කොළඹ 02.

# සංවර්ධන ලොතරැයි මණ්ඩලය

### මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## මෝටර් රථයක් අපහරණය කිරීම සඳහා ලංසු කැඳවීම

**ලංසු අංකය : - DLB/PRO/2025/35**

මෙම ආයතනයේ ධාවනයෙන් ඉවත් කර ඇති පහත සඳහන් මෝටර් රථය අපහරණය කිරීම සඳහා මේ පිළිබඳව උනන්දුවක් දක්වන්නන්ගෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් විවෘත ලංසු කැඳවනු ලැබේ.

| අංක | ලියාපදිංචි අංකය | නිෂ්පාදිත වසර | වාහන වර්ගය |
|---|---|---|---|
| 01 | WPKH - 9014 | 2009 | HYUNDAI |

02. වාහනය පරීක්ෂා කර බැලීම **2025.10.02** දින සිට **2025.10.23** දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව. 3.00 දක්වා සංවර්ධන ලොතරැයි මණ්ඩලය, අංක 356, ආචාර්ය කොල්වින් ආර් . ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02 හි පිහිටි මෙම කාර්යාලයේ දී සිදුකල හැකිය.

03. මේ සඳහා වන ප්‍රසම්පාදන ලියවිලි කට්ටලය ආපසු නොගෙවන රු.5000.00 ක (SSCL සහ VAT බදු සහිතව) පෝරම ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් **2025.10.02** සිට **2025.10.23** දක්වා සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීම මත සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රසම්පාදන අංශයෙන් ලබා ගත හැක.

04. මේ සඳහා ලංසු මිල ගණන් ඉදිරිපත් කිරීමේදී රු.100,000.00 ක ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදලක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මුදල් අයකැමි වෙත මුදලින් පමණක් ගෙවා ලබාගත් ලදුපතේ පිටපතක් මිල ගණන් පත්‍රිකාව සමඟ ඉදිරිපත් කල යුතුය. එම ආපසු ගෙවන ඇප තැන්පතු මුදල නොගෙවීම ලංසු අවලංගු වීමට හේතුවනු ඇත.

05. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි කට්ටලය සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, සංවර්ධන ලොතරැයි මණ්ඩලය අංක 356, ආචාර්ය කොල්වින් ආර් . ද සිල්වා මාවත, යුනියන් පෙදෙස කොළඹ 02 ලිපිනයට **2025.10.24** දින ප.ව **2.30**ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් මගින් එවීමට හෝ කාර්යාලීය ප්‍රසම්පාදන අංශයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිය හැකිය.

06. මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරේ "මෝටර් රථයක් අපහරණය කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම" යනුවෙන් සඳහන් කල යුතුය.

07. ලංසු ලියවිලි විවෘත කිරීම **2025.10.24** දින ප.ව **2.30** ට සිදු කරන අතර එම අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගි විය හැකිය.

08. මෙම ප්‍රසම්පාදනයට අදාලව ලංසු පැවරීම හෝ නොපැවරීම පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
අංක356, ආචාර්ය කොල්වින් ආර් . ද සිල්වා මාවත,
යුනියන් පෙදෙස, කොළඹ 02.
011-4824824
procurement@dlb.lk

2025.10.02

DLB/PRO/677

2025/10/02

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

## මෝටර් රථයක් අපහරණය කිරීම සඳහා ලංසු කැඳවීම

ලංසු අංක : - DLB/PRO/2025/35

**පොදු කොන්දේසි -**

01. මෙම ආයතනයේ භාවිතයෙන් ඉවත් කරන ලද පහත සඳහන් මෝටර් රථය අපහරණය කිරීමට තීරණය කර ඇති අතර මේ පිළිබඳව උනන්දුවක් දක්වන්නන්ගෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් විවෘත ලංසු කැඳවනු ලැබේ.ඒ අනුව භෞතික පාරීක්ෂාව සඳහා තබා ඇති මෙම මෝටර් රථයේ පවතින සියලුම සවිකිරීම් හා උපාංග පමණක් යෝජිත අපහරණයට ඇතුලත් වේ.

| | මෝටර් රථය පිළිබඳ තොරතුරු | | ආපසු ගෙවන ඇප තැන්පතු මුදල |
|---|---|---|---|
| 01 | ලියාපදිංචි අංකය | WP KH -9014 | රු.100,000/- |
| 02 | චැසියේ අංකය | KMHEU 41DMAA695492 | |
| 03 | එන්ජින් අංකය | 04KE9A067941 | |
| 04 | වාහන පංතිය | MOTOR CAR | |
| 05 | වර්ගය | HYUNDAI | |
| 06 | වර්ණය | BLACK | |
| 07 | ලියාපදිංචි දිනය | 2009.04.24 | |
| 08 | ධාරිතාවය | 2359CC | |
| 09 | ඉන්ධන වර්ගය | PETROL | |
| 10 | නිෂ්පාදිත වර්ෂය | 2009 | |
| 11 | නිෂ්පාදිත රට | KOREA | |

02. මෙම මෝටර් රථයේ ලියාපදිංචි සහතිකය එය මිලට ගන්නාට අයිතිය පැවරෙන සේ නිකුත් කරන අතර,රථය හුවමාරු කිරීමට අදාල ලියාපදිංචි ගාස්තු සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ගෙවනු නොලැබේ.

එසේම මෙම මෝටර් රථය අලෙවි කල දිනට පෙර ගෙවිය යුතු සුබෝපබෝගී බදු හෝ වෙනත් හිඟ ගෙවීමක් තිබුනහොත් එම ගෙවීම පමණක් මණ්ඩලය විසින් ප්‍රතිපූර්ණය කර දෙනු ලැබේ.

03. වාහනය පරීක්ෂාව 2025.10-02 සිට 2025.10.23 දින පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාර්යාලීය දින වලදී මෙම කාර්යාල පරිශ්‍රයේදී සිදු කල හැක.මෝටර් රථය පරීක්ෂාව සම්බන්ධීකරනය ප්‍රවාහන නිළධාරි විසින් සිදු කෙරේ. (දුරකථන අංකය 076-3018461)

04. මීට අදාල ලංසු ලියවිලි කට්ටලය ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් මත ආපසු නොගෙවනු ලබන රු. 5,000.00 ක (SSCL සහ VAT බදු සහිතව) පෝරම ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් පසු 2025.10.02 සිට 2025.10.23 දක්වා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රසම්පාදන අංශයෙන් කාර්යාලීය දින වල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා ලබා ගත හැක.

05. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී මිල ගණන් පෝරමයේ සදහන් පරිදි මූලික ලංසු වටිනාකමට අතිරේකව 2.5% ක සමාජ ආරක්ෂක දායක බද්ද (SSCL) වටිනාකම සහ 18% ක එකතු කල අගය මත බදු (VAT) වටිනාකම මණ්ඩලයට ගෙවිය යුතු අතර එම කරුණ සැලකිල්ලට ගෙන මේ සදහා මිල ගණන් ඉදිරිපත් කල යුතු වේ.

06. මේ සදහා ලංසු මිල ගණන් ඉදිරිපත් කිරීමේදී රු.100,000.00 ක ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදලක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මුදල් අයකැමි වෙත මුදලින් පමණක් ගෙවා ලබාගත් ලදුපතේ පිටපතක් මිල ගණන් පත්‍රිකාව සමඟ ඉදිරිපත් කල යුතුය. එම ආපසු ගෙවන ඇප තැන්පතු මුදල නොගෙවීම ලංසු අවලංගු වීමට හේතුවනු ඇත.

07. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි කට්ටලය පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කල යුතු අතර ඒවා මුල් පිටපත හා අනු පිටපත ලෙස සටහන් කොට වෙන වෙනම කවර දෙකක ඇතුලත් කර පසුව එම කවර දෙක එක් ලියුම් කවරයක බහා <u>සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, සංවර්ධන ලොතරැයි මණ්ඩලය අංක356, ආචාර්ය කොල්වින් ආර් . ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02</u> ලිපිනයට 2025.10.24 දින ප.ව 2.30ට පෙර ලැබෙන සේ හෝ ලියාපදිංචි තැපැල මගින් එවීම හෝ එම ලිපිනයෙහි ප්‍රසම්පාදන අංශයේ මේ සදහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනැවිත් බහාලිය හැකිය.

08. ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරේ **"මෝටර් රථයක් අපහරණය කිරීම සදහා මිල ගණන් ඉදිරිපත් කිරීම "** යනුවෙන් සදහන් කල යුතුය.

09. ලංසු විවෘත කිරීම 2025.10.24 ප.ව. 2.30ට මෙම කාර්යාලයේදී සිදු කරන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගි විය හැකිය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

10. එක් ඉල්ලුම්කරුවකුට එක් ලංසු ලියවිලි කට්ටලයක් පමණක් නිකුත් කෙරේ.ඔබගේ මිල ගණන් මණ්ඩලය මගින් නිකුත් කරන ලද නියමිත ලංසු ලියවිලි කට්ටලය මගින් පමණක් ඉදිරිපත් කල යුතුය.මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලංසු ලියවිලි කට්ටලයේ දක්වා ඇති අයිතමය ඉදිරියෙන් අකුරින් හා ඉලක්කමින් මිල සදහන් කල යුතු අතර එම මිල ගණන් වල නොගැලපීමක් පැවතිය හොත් අකුරින් ලියන ලද මිල ගණන නිවැරදි මිල සේ සලකා කටයුතු කරනු ලැබේ.

11. සාර්ථක ලංසුකරු වෙත ලංසු ප්‍රධානය කිරීම ලිඛිතව නිවේදනය කරනු ලැබේ. එම ලිපියේ සදහන් දින සිට දින 07 ක් ඇතුලත මිලදී ගැනීමේ වටිනාකම ප්‍රධාන කාර්යාලයට මුදලින් ගෙවා අදාල භාණ්ඩය ඉවත් කර ගත යුතුය. එසේ ඉවත් නොකර ගැනීමකදී තබා ඇති ආපසු ගෙවන ඇප තැන්පතු මුදල මණ්ඩලය සතු කෙරේ.එවැනි අවස්ථාවකදී රථය නැවත අලෙවි කිරීම පිළිබද තීරණය කිරීම මණ්ඩලය සතුය.

12. ලංසු ප්‍රධානය ලැබූ ලංසුකරු ලංසු කොන්දේසි කඩ කලහොත් හෝ ඊට අනුකූල නොවී කටයුතු කරන්නේ නම් ආපසු ගෙවන ටෙන්ඩර් ඇප මුදල සංවර්ධන ලොතරැයි මණ්ඩලය සතු කිරීමට කටයුතු කෙරේ.

13. ගැනුම්කරු වාහනය සඳහා මුදල් ගෙවා නිරවුල් කර ගැනීමෙන් පසුව කඩිනමින් එය කාර්යාල පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට කටයුතු කල යුතුය.

14. තෝරාගත් ගැනුම්කරු කාර්යාල පරිශ්‍රයට පැමිණීමෙන් පසුව ආයතනයේ පනවා ඇති නීති රීති වලට අනුකූලව කටයුතු කල යුතු අතර ආයතනයේ අනෙකුත් රාජකාරී කටයුතු වලට බාධා නොවනසේ සිය සහායකයන් හසුරුවා ගැනීමට වග බලා ගත යුතුයි.

15. කාර්යාලීය වේලාව තුල හැර පිටස්තර වේලාවන්හිදී භාණ්ඩ ඉවත් කර ගැනීමට ඉඩ නොදේ. ගැනුම්කරු පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පමණක් කාර්යාල පරිශ්‍රයේ රැදී සිටිය හැකි අතර ලංසුකරු සහ ඔවුන්ගේ සහායකයින් කාර්යාල පරිශ්‍රයෙන් ප.ව 3.00 පෙර ඉවත් විය යුතුයි.

16. අලෙවි කරන ලද රථය ආයතන භූමියෙන් පිටතට රැගෙන යාමේදී සිදුවන යම් අනතුරකින් ආයතනයේ දේපලකට අලාභ හානියක් සිදු වුවහොත් එම අලාභය තක්සේරු කර බලා ගැණුම්කරුගෙන් අයකර ගන්නා තුරු අලෙවි භාණ්ඩ බැහැර කිරිමට අවසර දෙනු නොලැබේ.

17. ගැණුම්කරු විසින් සිය ලංසු ප්‍රධානය අන්සතු නොකල යුතුය. ගැණුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කර බැහැර ගෙන යාමේ ගේට්ටු අවසර පත්‍ර නිකුත් කරන බැවින් ලංසුව අන්සතු නොකල යුතු වේ.

18. මෙම ප්‍රසම්පාදනයට අදාලව ලංසු පැවරීම හෝ නොපැවරීම පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුය.

19. රථය මිලදී ගැනිමේ දින සිට දින 14 ක් ඇතුලත එම රථය එය මිලදී ගන්නා අයගේ නමට ලියාපදිංචිය පැවරීම සිදු කර ගත යුතු වේ.එම ලියාපදිංචි සහතිකයේ පිටපත මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු කොන්දෙසී අංක 06 සඳහන් ආපසු ගෙවනු ලබන ඇප තැම්පතු මුදල නිදහස් කරනු ලැබේ.එලෙස ලියාපදිංචි සහතිකය ඉදිරිපත් නොකිරීම ආපසු ගෙවනු ලබන ඇප තැම්පතු මුදල නිදහස් නොකිරීමට හේතු වන බවද සැලකිය යුතුය.

20. මේ පිළිබඳව යම් වැඩිදුර විස්තර අවශ්‍ය වේ නම් අංක 076-9475871 / 011-4824824 මගින් සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) ඇමතීමෙන් ලබාගත හැකිය.

සභාපති,

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,

සංවර්ධන ලොතරැයි මණ්ඩලය,

අංක356, ආචාර්ය කොල්වින් ආර් . ද සිල්වා මාවත,

යූනියන් පෙදෙස, කොළඹ 02.

011- 4824824

(ලංසුකරුවන් විසින් සම්පූර්ණ කිරීම සඳහා)

# මිල ගණන් පෝරමය
# මෝටර් රථයක් අපහරණය කිරීම සඳහා ලංසු කැඳවීම
# ලංසු අංකය :- DLB/PRO/2025/35

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
අංක356, ආචාර්ය කොල්වින් ආර් . ද සිල්වා මාවත,
යුනියන් පෙදෙස,
කොළඹ 02.

01. ලංසුකරුගේ නම :- ..........................................................................................................

02. ස්ථිර ලිපිණය :- ..........................................................................................................

..........................................................................................................

03. ජාතික හැඳුනුම් පත් අංකය :-...................................... 04. දුරකථන අංකය :-.........................

05. ගෙවන ලද ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පතු මුදල (රු.) 06. ලදුපත් අංකය : -

........................................

07. මෝටර් රථය මිලට ගැනිමට අපේක්ෂිත මිල ගණන් පහත සඳහන් කරන්න.

**(ලංසු කොන්දේසි අංක 05 හොඳින් කියවා බලා මිල ගණන් ඉදිරිපත් කළ යුතු වේ)**

| ලියාපදිංචි අංකය - WPKH - 9014 | මෝටර් රථය මිලට ගැනිමට අපේක්ෂිත මිල ගණන් | |
|---|---|---|
| | ඉලක්කමෙන් (රු.) | අකුරින් |
| මෝටර් රථයේ ලංසු වටිනාකම (SSCL සහ VAT බදු රහිතව) | | |
| එකතු :- සමාජ ආරක්ෂක දායක බද්ද (SSCL 2.5%) | | |
| **වටිනාකම SSCL බදු සහිතව** | | |
| එකතු :- වැට් බදු 18% (VAT) | | |
| **මුළු වටිනාකම VAT බදු සහිතව** | | |

**(මිල ගණන් වෙනස් කිරීමකදී 'ලංසුකරුගේ' සම්පූර්ණ අත්සන එම ස්ථානයේ තැබිය යුතුය)**

08. ඉහත සඳහන් සියළුම ලංසු කොන්දේසි මා විසින් කියවා බලා තේරුම්ගෙන ඇති බවත්, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය බවත් ලංසු කොන්දේසි වලට අනුව කටයුතු කිරීමට එකඟව ඉහත සඳහන් මිල ගණන් ඉදිරිපත් කරමි.

ලංසුකරුගේ අත්සන :- ..........................................................................

ලංසුකරුගේ නම :- ..........................................................................

දිනය : - ..........................................................................